# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1179/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
17/07/2024
පැය 1200

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - මැල්සිරිපුර පොලිස් වසම.

2024.07.17 වන අද දින අළුයම් කාලයේ මැල්සිරිපුර පොලිස් වසමේ දඹුල්ල කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ පන්ලියද්ද ප්‍රදේශයේදී කොළඹ සිට ත්‍රිකුණාමලය දක්වා ධාවනය වූ අධි සුඛෝපභෝගී බස් රථයක් මඩකලපුව සිට කොළඹ දක්වා ධාවනය වූ අධි සුඛෝපභෝගී බස් රථයක ගැටී අනතුරක් සිදු ව ඇත. අනතුරින් බස් රථ රියදුරන් දෙදෙනා හා මඟීන් 07 දෙනෙකු තුවාල ලබා ගොකරැල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ත්‍රිකුණාමලය දක්වා ධාවනය වූ බස් රථයේ රියදුරු මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ මැල්සිරිපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ත්‍රිකුණාමලය දෙසට ධාවනය වූ බස් රථය වාහන පෙලකට ඉස්සර කිරීමට මාර්ගයේ දකුණු පසින් ධාවනය කිරීමේදී විරුද්ධ දෙසින් පැමිණි බස් රථයේ ගැටී ඇති බවට විමර්ශනයේදී අනාවරණයට වී ඇත. තුවාලකරුවන් වයස අවුරුදු 16ත් 70ත් අතර වයස් වල පසුවන කොළඹ, මොරටුව, නිලාවේලි, මඩකලපුව හා ත්‍රිකුණාමලය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පොල්ගොල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැල්සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - අග්බෝපුර පොලිස් වසම.

2024.07.17 වන අද දින උදෑසන කාලයේ අග්බෝපුර පොලිස් වසමේ හබරණ ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයේ කිතුල් උතුව ප්‍රදේශයේදී හබරණ දෙස සිට ත්‍රිකුණාමලය දෙසට ධාවනය වූ වෑන් රථයක් මාර්ගයේ පාගමනින් ගමන් කළ

කාන්තවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව කන්තලේ රෝහලට ඇතුලත් කිරිමේදී මිය ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වූ නාවච්චිකුඩා, චීන වරාය ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘත ශරීරය කන්තලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අග්බෝපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - හබරණ පොලිස් වසම.

2024.07.17 වන අද දින අළුයම් කාලයේ හබරණ පොලිස් වසමේ හබරණ දඹුල්ල ප්‍රධාන මාර්ගයේ ඉදිගස්වැව හංදිය ආසන්නයේදී දඹුල්ල දෙස සිට හබරණ දෙසට ධාවනය වූ බස් රථයක මාර්ගය හරහා ගමන්කල පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා හබරණ ග්‍රාමීය රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ සීගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

මෘත ශරීරය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණය දඹුල්ල රෝහලේදී සිදු කිරීමට නිමිතව ඇත. බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර හබරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**